# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1877/30 – 2014 අගෝස්තු 28 වැනි බ්‍රහස්පතින්දා – 2014.08.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: CI/1794.

### කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 15, කොළඹ වරාය. තටාක පෙදෙස, තැ.පෙ. 906හි පිහිටා ඇති කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 15, කොළඹ වරාය, තටාක පෙදෙස, තැ. පෙ. 906හි පිහිටා ඇති ස්වාධීන තටාක සේවක සංගමය අතර 2014 මැයි මස 22 වැනි දින ඇතිකර ගන්නා ලද සාමූහික ගිවිසුම් පත්‍රය ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වැනි වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
වැ. බ. - කම්කරු කොමසාරිස් ජනරාල්.

2014 අගෝස්තු මස 18 වැනි දින,

කොළඹ 05,

කම්කරු දෙපාර්තමේන්තුව



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2014 අංක 26 දරන සාමූහික ගිවිසුම

## සාමූහික ගිවිසුම

කලම්බු ඩොක්යාඩ් පීඑල්සී

සහ

ස්වාධීන තටාක සේවක සංගමය

මෙම සාමූහික ගිවිසුම 2014 වර්ෂයේ මැයි මස 22 වැනි දින කාර්මික ආරවුල් පනත අනුව ශ්‍රී ලංකාවේ විධිමත් පරිදි ලියාපදිංචි කළ සමාගමක් වන එහි ලියාපදිංචි කාර්යාලය කලම්බු ඩොක්යාඩ් පීඑල්සී, කොළඹ 15, කොළඹ වරාය, තටාක පෙදෙස, තැ. පෙ. 906හි ඇති (මින් මතු සේව්‍යයා යනුවෙන් සඳහන් කරනු ලබන) කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සහ ශ්‍රී ලංකාවේ විධිමත් පරිදි ලියාපදිංචි කළ වෘත්තිය සමිතියක් වන සහ එහි ලියාපදිංචි කාර්යාලය, කොළඹ 15, කොළඹ වරාය, තටාක පෙදෙස, තැ. පෙ. 906හි ඇති (මින් මතු සංගමය යනුවෙන් සඳහන් කරනු ලබන) ස්වාධීන තටාක සේවක සංගමය සමග ඇතිකරගත් සාමූහික ගිවිසුමය.

1. ***ශීර්ෂ නාමය:*** මෙම ගිවිසුම කලම්බු ඩොක්යාඩ් - පීඑල්සී සේවක සාමූහික ගිවිසුම 2014 - 2016 යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ***ආවරණය වන සහ බැඳෙන පාර්ශ්වයන්.***- මෙම ගිවිසුමෙන් සේව්‍යයා, සංගමය සහ එකඟතාවයකට පැමිණීමට නියමිත වැටුප් පරිමානයන්ට අදාළ සේවා කාණ්ඩවල, ස්ථිර සේවා ගිවිසුම් මත සේව්‍යයා විසින් සේවයේ අනුයුක්ත කර ඇති, මෙහි මින්මතු අවශ්‍ය වන පරිදි සේවකයා හෝ සේවකයින් යනුවෙන් සඳහන් කරනු ලබන සංගමයේ සාමාජිකයින් ආවරණය වන සහ බැඳෙනු ලැබේ.

3. ***ගිවිසුම බලපවත්වන කාල පරිච්ඡේදය.***- මෙම ගිවිසුම 2014 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වී 2016 දෙසැම්බර් මස 31 වන දින දක්වා අඛණ්ඩව බලාත්මක වනු ලැබේ.

4. ***ප්‍රතිපත්ති ප්‍රකාශනය***- මෙම ගිවිසුම ඇති කර ගැනීමට ප්‍රථම බලපැවැත් වූ සාමූහික ගිවිසුම්වල පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඇති කරගන්නා ලද එකඟතාවයන් එලෙසම ක්‍රියාත්මක වනු ඇත. මෙම ගිවිසුමට අදාළ වන සේවා කොන්දේසි සහ නියමයන් වෙනස් නොකිරීමට හෝ විකෘති නොකිරීමට සේව්‍යයාද, සේවකයින්ද, සංගමය ද ඒකාබද්ධව ගිවිස ගනී. මෙම ගිවිසුම බලාත්මකව පවතින කාල සීමාව තුළ ගිවිසුමේ ප්‍රතිපාදනයන් අභිබවා යන පරිදි වෙනත් පාර්ශ්වයන් සමග එකඟතාවයට එළඹීමට සේව්‍යයා හෝ සංගමය කටයුතු නොකරනු ඇත. කෙසේ වෙතත් අනපේක්ෂිත තත්ත්වයක් හේතුකොට ගෙන ආයතනය තුළ ඇතිවන්නා වූ අර්බුදකාරී අවස්ථාවක දී මෙම ගිවිසුමේ සඳහන් කරුණු නැවත සලකා බැලීමට හෝ අවශ්‍යතාවය මත දෙපාර්ශ්වයේම එකඟතාවය අනුව මෙම ගිවිසුමට සංශෝධන ඉදිරිපත් කිරීමේ අයිතිය ඇත.

ආයතනය හෝ සේවකයන් සම්බන්ධයෙන් එහි/ඔවුන්ගේ ඵලදායීතාවය, මනා කාර්ය සාධනය, කාර්යක්ෂමතාවය සහ සංවර්ධනය උදෙසා තුඩු දෙනවායැයි පාලනාධිකාරිය විසින් විශ්වාසය තබන ඕනෑම ආකාරයේ යෝජනා හෝ කරුණු පිළිබඳව පාලනාධිකාරිය ඉල්ලා සිටින විටදී පූර්ව කොන්දේසියකින් තොරව සාකච්ඡා සඳහා එළඹීමට දෙපාර්ශ්වය එකඟ වේ.

එමෙන්ම ඉහත සඳහන් කරුණුවලට අදාලව සංගමය විසින් පාලනාධිකාරියෙන් ඉල්ලා සිටින විටදී පූර්ව කොන්දේසියකින් තොරව සාකච්ඡා සඳහා එළඹීමටද දෙපාර්ශ්වය එකඟ වේ.

| ගිවිසුම් වර්ෂය | වගන්ති අංකය | කරුණ |
|---|---|---|
| | 12 | ප්‍රසාද මුදල් |
| | 20 | සේවකයෙකුගේ මරණය |
| | 24 | දැනට භුක්ති විඳිනු ලබන හිමිකම් / ප්‍රතිලාභ සහ සහන |
| | 25 | සේවක සුහද හමුව |
| 2002 - 2004 | 9 | සේවක පුරප්පාඩු (ඇ /ඈ වගන්තිය තවදුරටත් බල නොපානු ඇත) |
| | 14 | වෛද්‍ය පරීක්ෂණවලට යොමුකිරීම |
| | 20 | සේවක වෘත්තීය අධ්‍යාපනය |
| | 23 | මැතිවරණ, ඇඳිරි නීතිය පැනවීම යනාදි නිවාඩු |
| | 25 | විදේශ ගතවීම සඳහා පඩිරහිත නිවාඩු |
| | 27 | ස්ථාන මාරුවීම් |
| | 28 | දිවා / රාත්‍රී ආහාර විවේකය |
| | 29 | කාර්මික ආරක්ෂාව |
| | 30 | ආයතනයේ විනය පවත්වාගෙන යෑම |
| | 32 | කාර්මික ආරවුල් බේරුම් කිරීම |
| 2005 - 2007 | 06 | වැටුප් පරිමාණයන් හා වැටුප් වර්ධක (ආ වගන්තිය නොවෙනස්ව පවතිනු ඇත) |
| | 14 | වෘත්තීය සමිතියේ වාර්ෂික මහාසභා රැස්වීම |
| | 16 | Stand by අවස්ථාවකදී වෙනත් අංශයක රාජකාරිය සඳහා යෙදවීම |
| 2008 - 2010 | 05 (ii) | වාර්ෂික කාර්යය සාධනය ඇගයීමේ ක්‍රියාපටිපාටිය |
| | 05 (iv) | අතිකාල ගණනය |
| | 05 (v) | අතිකාල ගණනය කිරීම විධිමත් කිරීම |
| | 06 | උපයනවිට ගෙවීමේ බද්ධ අඩුකිරීම |
| | 07 | විශ්‍රාමික දීමනා |
| | 08 | රන් තිළින ප්‍රදානය |
| | 09 | උසස්වීම් |
| | 10 (ii) | ස්ථානුරූපී පදනම මත ආධුනිකයින් බඳවා ගැනීම |
| | 12 | උදෑසන ආහාරවේල නොමිලේ ලබාදීම |
| | 13 (i)(ඉ) | වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන දූදරුවන්ගේ වයස් සීමාවන් |
| | 13 (i)(ඒ) | බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම |
| | 13 (ii)(අ) | වෛද්‍ය යැපීම් දීමනාව |
| | 13 (iii)(i) | දූදරු ශිෂ්‍යත්ව |
| | 13 (v) | නුවරඑළිය නිවාඩු නිකේතනය වෙන්කර ගැනීම |
| | 14 | වැඩ පැවරීමේ පත් |
| 2011 - 2013 | 04 | ප්‍රතිපත්ති ප්‍රකාශනය |
| | 05 (ඇ) | වැටුප් හා දීමනා |
| | 06 | වාර්ෂික කාර්යය සාධනය ඇගයීමේ ක්‍රියාපටිපාටිය |
| | 07 | සේවක පුරප්පාඩු |
| | 10 | නව වැටුප් පරිමාණයක් හඳුන්වාදීම |
| | 11 | සේවය ස්ථිර කිරීම |

05. *වැටුප් හා දීමනා.-*

(අ) වැටුප් හා දීමනාවන් වැඩිකිරීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ප්‍රතිපාදන වෙන් කරනු ඇත. කෙසේ වුවද, ආයතනයට මූල්‍යමය අර්බුදකාරී තත්වයකට මුහුණදීමට සිදුවුවහොත් මෙම ගිවිසුමේ 4 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ඇත.

| වර්ෂය | මූලික වැටුප වෙනුවෙන් | දීමනාවන් වෙනුවෙන් |
|---|---|---|
| 2014 | රුපියල් මිලියන 112 | රුපියල් මිලියන 28 |
| 2015 | රුපියල් මිලියන 112 | රුපියල් මිලියන 26 |
| 2016 | රුපියල් මිලියන 112 | රුපියල් මිලියන 26 |

(ආ) 2014, 2015 හා 2016 වර්ෂයන්ට අදාලව වැටුප්, දීමනා හා අදාල අනෙකුත් කරුණු නිශ්චය කරගැනීම සඳහා පිටු අංක 05 සහ 06 වගු අදාල කරගනු ඇත. නව වැටුප් පරිමාණයන් පිටු අංක 11 සඳහන් පරිදි වේ.

06. ***සේවක උසස්වීම්.***- එළඹෙන වසරට උසස්වීම් සඳහා සුදුසුකම් ලබන සේවක මහතුන්ගේ ලිඛිත / පරීක්ෂණ කලින් වර්ෂය තුළ සිදුකිරීමටත්, ලිඛිත හෝ ප්‍රායෝගික පරීක්ෂණයේ ප්‍රතිඵල එම සේවක මහතුන් වෙත දැනුම්දීමටත් කටයුතු කෙරෙනු ඇත.

07. ***ලිපිකාර ශ්‍රේණියට බඳවා ගැනීම.***- ලිපිකාර ශ්‍රේණියට අදාල සේවක මහතුන් 60 ක අවමයකින් පවත්වාගෙන යාමට එකඟ වන අතර, ඔවුන් අතරින් කිසියම් සේවක මහතෙකු විධායක ශ්‍රේණියට උසස් කරනු ලැබුවහොත් එම ලිපිකාර තනතුරට අදාලව පුරප්පාඩුවක් පවතින්නේද යන්න පිලිබඳව විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව බඳවාගැනීම් පිලිබඳව කටයුතු කරනු ඇත.

08. ***කෙටිකාලීන විදේශ පුහුණු පාඨමාලාව.***- තෝරාගත් විශේෂ වෘත්තීන් කිහිපයක් සඳහා කෙටිකාලීන විදේශ පුහුණුවක් අවශ්‍ය යැයි හැඟීයන විටදී ඒ සඳහා යොමු කිරීමටද, ආයතනය වෙත යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමට විදේශගත වන අවස්ථාවන්වලදී එම යන්ත්‍රය ක්‍රියාකරවන සේවක මහතාද යොමු කිරීමට අවශ්‍ය යැයි හැඟී යන විටදී, ඒ සඳහා අවස්ථාවක් ලබාදීමට කටයුතු කරනු ඇත.

09. ***යාත්‍රා අංශයේ රාජකාරියේ නියැලෙන සේවක මහතුන්.***- යාත්‍රා අංශයේ සේවක මහතුන්හට සුදුසු රාජකාරියක් පවරා කාලසටහනකට අනුව අතිකාල සේවයේ යෙදවීමට කටයුතු කරනු ඇත.

10. ***නිවාඩු අනුමත කිරීමේ බලතල ලබාදීම.***- ජ්‍යෙෂ්ඨ වැඩමූලික මහතුන් තෝරාගෙන ඔවුන්හට එක් අනියම් / අසනීප නිවාඩු දිනයක් අනුමත කිරීමේ බලතල ලබාදීමට කටයුතු කරනු ඇත.

11. ***ගැඹුරු මුහුදේ රාජකාරි කටයුතු වල නියැලීමෙන් පසු ලබාදෙන විවේක දිනයන්.***- නොකඩවා දින 03ක් හෝ ඊට අඩු කාලයක් රාජකාරි කටයුතු වල නිරතවී ආපසු පැමිණීමෙන් අනතුරුව එක් විවේක දිනයක්ද, දින 04 හෝ ඊට වැඩි අවස්ථාවකදී දින 02 ක් ලබා දීමට කටයුතු කරනු ඇත.

12. ***ජංගම දුරකථන සිම්පත් ලබාදීම.***- නවගොඩනැගුම් (NC) හා නැව් අළුත්වැඩියා අංශයන්හි (FIS Field)යන අංශයන්හි රාජකාරි කටයුතු ඉටු කරන වැඩමූලික, පරිපාලක හා කණ්ඩායම් නායකයින් සඳහා ආයතනය ඇතුලත පමණක් නොමිලේ ඇමතුම් ලබාගත හැකි ජංගම දුරකථන සිම්පත් ලබාදීමට කටයුතු කරනු ඇත.

13. ***රාජකාරි කටයුතු සඳහා යතුරුපැදි භාවිතා කිරීම.***- රාජකාරි කටයුතු සඳහා යතුරුපැදි භාවිතා කිරීමේදී ඊට අදාලව ඉන්ධන දීමනාවක් ලබාදීමට එකඟවේ.

14. ***සේවක මහතුන්ගේ වැඩ / හැසිරීම පිළිබඳව ධනාත්මක හෝ ඍණාත්මක සිද්ධීන් පරිගණකගත කිරීම*** (Critical Incident).- සේවක මහතකුගේ කිසියම් ධනාත්මක හෝ ඍණාත්මක සිද්ධියක් පරිගණකගත කිරීමට පෙර ඒ පිළිබඳව එම සේවක මහතා දැනුවත් කිරීමට කටයුතු කරන අතර, සේවක මහතාහට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදීමෙන් අනතුරුව පරිගණකගත කිරීමට කටයුතු කරනු ඇත.

15. ***බණ්ඩනය වූ සේවා කාලය.***- 2011 - 2013 සාමූහික ගිවිසුමට අනුව බණ්ඩනය වූ පූර්ව සේවා කාලය සැලකිල්ලට භාජනය කිරීම දත්තයන් විශ්ලේෂණයෙන් පසු මාස 03ක් ඇතුලත තීරණයකට එළඹෙනු ඇත.

## සාමූහික ගිවිසුම 2014/2016

### වැටුප සහ ඊට ඇතුළත්වන සෙසු දීමනා

| අංකය | විෂයය | පවතින ආකාරය | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| 1 | මූලික වැටුප | | රු. 2,500/- ක සම්මත මුදලකින් සහ සේවා කාලය පදනම්කොට ගෙන වර්ෂයකට රු. 125/- බැගින් ලබාදීමට කටයුතු කෙරේ.<br>පරිපාලක ශ්‍රේණි සඳහා රු. 658/ක්ද වැඩමූලික ශ්‍රේණි සඳහා රු. 822/-ක්ද මූලික වැටුපට එකතු කෙරේ. | රු. 2,500/- ක සම්මත මුදලකින් සහ සේවා කාලය පදනම්කොට ගෙන වර්ෂයකට රු. 125/- බැගින් ලබාදීමට කටයුතු කෙරේ.<br>පරිපාලක ශ්‍රේණි සඳහා රු. 714/ක්ද වැඩමූලික ශ්‍රේණි සඳහා රු. 893/-ක්ද මූලික වැටුපට එකතු කෙරේ. | රු. 2,500/- ක සම්මත මුදලකින් සහ සේවා කාලය පදනම්කොට ගෙන වර්ෂයකට රු. 125/- බැගින් ලබාදීමට කටයුතු කෙරේ.<br>පරිපාලක ශ්‍රේණි සඳහා රු. 771/ක්ද වැඩමූලික ශ්‍රේණි සඳහා රු.964/-ක්ද මූලික වැටුපට එකතු කෙරේ. |
| 2 | නිෂ්පාදනයට සෘජු ලෙස දායකවන සේවක මහතුන් සඳහා ලබාදෙන දීමනාව | පැය 100ට වැඩි රු. 1,180/-<br>පැය 50<100 රු. 590/- | පැය 100ට වැඩි රු. 1,302/-<br>පැය 50<100 රු. 651/- | පැය 100ට වැඩි රු. 1,413/-<br>පැය 50<100 රු. 707/- | පැය 100ට වැඩි රු. 1,524/-<br>පැය 50<100 රු. 763/- |
| 3 | පරිපාලක/වැඩමූලික දීමනාව | පරිපාලක රු. 4,968/-<br>වැඩමූලික රු. 6,210/- | රු. 5,482/- දක්වා වැඩි කෙරේ.<br>රු. 6,852/- දක්වා වැඩි කෙරේ. | රු. 5,953/- දක්වා වැඩි කෙරේ.<br>රු. 7,441/- දක්වා වැඩි කෙරේ. | රු. 6,424/- දක්වා වැඩි කෙරේ.<br>රු. 8,030/- දක්වා වැඩි කෙරේ. |
| 4 | පැමිණීමේ දිරි දීමනාව | කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා දිනකට රු. 415/-<br>පරිපාලක හා වැඩමූලික ශ්‍රේණි සඳහා දිනකට රු. 439/- | කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා දිනකට රු. 457.70<br>පරිපාලක හා වැඩමූලික ශ්‍රේණි සඳහා දිනකට රු. 484/- | කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා දිනකට රු. 497.20<br>පරිපාලක හා වැඩමූලික ශ්‍රේණි සඳහා දිනකට රු. 526/- | කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා දිනකට රු. 536.70<br>පරිපාලක හා වැඩමූලික ශ්‍රේණි සඳහා දිනකට රු. 568/- |
| | | | වැඩිකරන ලද මුදල ගෙවනුයේ පැමිණීමේ දීමනාව සම්බන්ධව 2002/2004 සාමූහික ගිවිසුමේ 6 වන වගන්තිය ප්‍රකාරව ප්‍රමාදනොවී සේවයට වාර්තා කිරීම වෙනුවෙනි. රටේ ඇතිවන හදිසි තත්ත්වයක් හේතුවෙන් ප්‍රමාදවී පැමිණීම / නියමිත කාලයට ප්‍රථම සේවයෙන් මිදීයාම යන අවස්ථාවන්හිදී පැමිණීමේ දීමනාව නියමිත ආකාරයට ගෙවනු ඇත. | | |
| | සේවක ඇගයීම – කාර්මික ශ්‍රේණි/ලිපිකාර/වැඩමූලික හා පරිපාලක වසර 08 ක් සම්පූර්ණ කිරීම වෙනුවෙන් වූ මාසික දීමනාව | ලිපිකාර, වැඩමූලික හා පරිපාලක ශ්‍රේණි සඳහා රු. 1,550/-<br>කාර්මික ශ්‍රේණි සඳහා රු. 2,795/- | ලිපිකාර, වැඩමූලික හා පරිපාලක ශ්‍රේණි සඳහා දිනකට රු. 1,710/-<br>කාර්මික ශ්‍රේණි සඳහා රු. 3,080/- | ලිපිකාර, වැඩමූලික හා පරිපාලක ශ්‍රේණි සඳහා දිනකට රු. 1,857/-<br>කාර්මික ශ්‍රේණි සඳහා රු. 3,345/- | ලිපිකාර, වැඩමූලික හා පරිපාලක ශ්‍රේණි සඳහා දිනකට රු. 2,004/-<br>කාර්මික ශ්‍රේණි සඳහා රු. 3,610/- |
| | සේවක ඇගයීම – ලිපිකාර ශ්‍රේණියේ Supra / Snr. Staff Asst. / Staff Asst. සඳහා දීමනාව | Supra Rs. 2,920/-<br>Snr. Staff Asst. Rs. 1,553/-<br>Staff Asst. Rs. 1,242/- | Supra Rs. 3,222/-<br>Snr. Staff Asst. Rs. 1,720/-<br>Staff Asst. Rs. 1,370/- | Supra Rs. 3,500/-<br>Snr. Staff Asst. Rs. 1,867/-<br>Staff Asst. Rs. 1,488/- | Supra Rs. 3,778/-<br>Snr. Staff Asst. Rs. 2,014/-<br>Staff Asst. Rs. 1,606/- |
| 5 | ක්ෂෙත්‍ර ලිපිකාර දීමනාව | මසකට රු. 2,500/- දීමනාවක් | රු. 2,758/- | රු. 2,995/- | රු. 3,232/- |
| 6 | කණ්ඩායම් නායක තනතුර සඳහා | මසකට රු. 1,550/- දීමනාවක් | රු. 1,710/- | රු. 1,857/- | රු. 2,004/- |
| 7 | විකිරණ ශිල්පීන් සඳහා | මසකට රු. 1,550/- දීමනාවක් | රු. 1,710/- | රු. 1,857/- | රු. 2,004/- |
| 8 | රාත්‍රි වැඩ මුරයේ අතිකාල විධිමත්කිරීම වෙනුවෙන් ගෙවන දීමනාව | එක් රාත්‍රි වැඩ මුරයකට රු. 1,200/- | රු. 1,324/- | රු. 1,438/- | රු. 1,552/- |
| | | | මෙම දීමනාව සංශෝධනය කරනුයේ සියළු දීමනාවන් සඳහා නිශ්චිත මුදල් ප්‍රමාණයක් වෙන්කළ අවස්ථාවකදී පමණක් වේ.<br>තවද මෙම දීමනාවට හිමිකම් ලැබෙනුයේ 2014 ජනවාරි 01 දිනට පෙර මෙම වරප්‍රසාදය භුක්තිවිඳි සේවක මහතුන් සඳහා පමණි. | | |

## සාමූහික ගිවිසුම 2014/2016

### වැටුපට ඇතුළත් නොවන සෙසු දීමනා

| අංක | විෂයය | පවතින ආකාරය | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| 1 | විදේශගතවීම් වෙනුවෙන් වන යැපීම් දීමනාවන් (ආහාර, නවාතැන් පහසුකම් හා ප්‍රවාහන පහසුකම් සහිතව) ව්‍යාපෘති / නැව් අළුත්වැඩියා / වගකීම් සහිත කාලසීමාවන් | කාර්මික ශ්‍රේණි ඇ. ඩොලර් 150 කි.<br>පරිපාලක හා වැඩමූලික ඇ. ඩොලර් 200 කි.<br>(මුල් දින 05 සඳහා)<br><br>වැඩිවන සෑම දිනයක් සඳහාම කාර්මික ශ්‍රේණි ඇ. ඩොලර් 20 කි.<br>පරිපාලක හා වැඩමූලික ඇ. ඩොලර් 30 කි. | කාර්මික ශ්‍රේණි සඳහා ඇමෙරිකානු ඩොලර් 165 කි.<br>පරිපාලක හා වැඩමූලික ශ්‍රේණි සඳහා ඇමෙරිකානු ඩොලර් 220 කි.<br>(මුල් දින 05 සඳහා)<br><br>වැඩිවන සෑම දිනයක් සඳහාම<br>කාර්මික ශ්‍රේණි සඳහා ඇමෙරිකානු ඩොලර් 22 කි.<br>පරිපාලක හා වැඩමූලික ශ්‍රේණි සඳහා ඇමෙරිකානු ඩොලර් 33 කි. | | |
| 2 | දොඹකර ක්‍රියාකරුවන්ගේ දුෂ්කර දීමනාව | සාමාන්‍ය රු. 31/-<br>ටවර් රු. 43/- | රු. 34.20<br>රු. 47.45 | රු. 37/-<br>රු. 51.45 | රු. 39.80<br>රු. 55.45 |
| 3 | ඉන්ධන දීමනාව | **කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා**<br>කි.මී. 1 ට රු. 3.10<br>(උපරිම කි.මී. 32 කි)<br><br>**විශේෂ ශ්‍රේණියේ වසර 05 ක් සඳහා**<br>කි.මී. 1 ට රු. 6.20<br>(උපරිම කි.මී. 40 කි)<br><br>**වැඩමූලික පරිපාලක හා සුප්‍රා ශ්‍රේණි සඳහා**<br>කි.මී. 1 ට රු. 8.75<br>(උපරිම කි.මී. 40 කි) | **කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා**<br>කි.මී. 1 ට රු. 3.42<br>(උපරිම කි.මී. 32 කි)<br><br>**විශේෂ ශ්‍රේණියේ වසර 05 ක් සඳහා**<br>කි.මී. 1 ට රු. 6.85<br>(උපරිම කි.මී. 40 කි)<br><br>**වැඩමූලික පරිපාලක හා සුප්‍රා ශ්‍රේණි සඳහා**<br>කි.මී. 1 ට රු. 9.65<br>(උපරිම කි.මී. 40 කි) | **කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා**<br>කි.මී. 1 ට රු. 3.72<br>(උපරිම කි.මී. 32 කි)<br><br>**විශේෂ ශ්‍රේණියේ වසර 05 ක් සඳහා**<br>කි.මී. 1 ට රු. 7.45<br>(උපරිම කි.මී. 40 කි)<br><br>**වැඩමූලික පරිපාලක හා සුප්‍රා ශ්‍රේණි සඳහා**<br>කි.මී. 1 ට රු. 10.45<br>(උපරිම කි.මී. 40 කි) | **කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා**<br>කි.මී. 1 ට රු. 4.02<br>(උපරිම කි.මී. 32 කි)<br><br>**විශේෂ ශ්‍රේණියේ වසර 05 ක් සඳහා**<br>කි.මී. 1 ට රු. 8.05<br>(උපරිම කි.මී. 40 කි)<br><br>**වැඩමූලික පරිපාලක හා සුප්‍රා ශ්‍රේණි සඳහා**<br>කි.මී. 1 ට රු. 11.25<br>(උපරිම කි.මී. 40 කි) |
| | වාහන නඩත්තු දීමනා<br>(නඩත්තු දීමනාව ලබාගැනීම සඳහා අවම වශයෙන් දින 15 ක් රථ වාහනය මගින් සේවයට වාර්තා කළ යුතුය.) | වැඩමූලික රු. 3,105/-<br>පරිපාලක රු. 2,484/- | වැඩමූලික රු. 3,426/-<br>පරිපාලක රු. 2,741/- | වැඩමූලික රු. 3,720/-<br>පරිපාලක රු. 2,977/- | වැඩමූලික රු. 4,014/-<br>පරිපාලක රු. 3,213/- |

16. **CDL** *සංචිතයට අදාළ වැටුප් හා දීමනා.-*

| *විෂයය* | | | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| මූලික වැටුප් වැඩිවීම | | | රු. 2,250/- | රු. 2,250/- | රු. 2,250/- |
| පැමිණීමේ දීමනාව | පැස්සුම්කරුවන් හා වානේ තහඩු පිරිසැකසුම්කරුවන් | කාර්මික ශ්‍රේණි | රු. 239.35 | රු. 259.94 | රු. 280.73 |
| | | පරිපාලක ශ්‍රේණි | රු. 273.54 | රු. 297.07 | රු. 320.83 |
| | අනිකුත් කාර්මික වෘත්තීන් | කාර්මික ශ්‍රේණි | රු. 205.16 | රු. 222.80 | රු. 240.63 |
| | | පරිපාලක ශ්‍රේණි | රු. 239.35 | රු. 259.94 | රු. 280.73 |
| | ලිපිකරුවන් හා අනිකුත් වෘත්තීන් | | රු. 185.30 | රු. 201.24 | රු. 217.34 |
| | පැමිණීමේ දීමනාව සඳහා නියමිත මාසයේ දී සේවයට වාර්තා කළ යුතු අවම දින ගණන සපුරා තිබිය යුතුය. | | | | |
| වාර්ෂික වේතනාධිකයන් | ඇගයීමක් සිදුකිරීමෙන් අනතුරුව පඩි රහිත නිවාඩු ලබා නොගත් සේවක මහතුන් හට පමණක් උපරිම වශයෙන් වේතනාධික 02 ක් ලබාදීමට කටයුතු කෙරේ. එක් වේතනාධිකයක අගය රු. 230-කි. | | | | |
| අවම වැටුප | පැස්සුම්කරුවන් හා වානේ තහඩු පිරිසැකසුම්කරුවන් | | රු. 16,000/- | | |
| | අනිකුත් කාර්මික වෘත්තීන් | | රු. 15,000/- | | |
| | ලිපිකරුවන් හා නිෂ්පාදන නොවන ශ්‍රේණි | | රු. 14,000/- | | |

17. ***සේවක සුබසාධනය.-***

(i) **නිවාස හා යතුරු පැදි ණය මුදල**

(අ) ආයතනය මගින් ලබාදෙනු ලබන නිවාස හා වාහන ණය මුදල පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

| *සේවා කාලය* | *දැනට පවතින නිවාස ණය මුදල* | *සංශෝධිත ණය මුදල* |
|---|---|---|
| වසර 03 සිට 05 දක්වා | 250,000/- | 300,000/- |
| වසර 06 සිට 08 දක්වා | 300,000/- | 350,000/- |
| වසර 09 සිට 12 දක්වා | 350,000/- | 400,000/- |
| වසර 12 ට වැඩි | 450,000/- | 500,000/- |

| *ශ්‍රේණි* | *දැනට පවතින වාහන ණය මුදල* | *සංශෝධිත ණය මුදල* |
|---|---|---|
| කාර්මික හා ලිපිකාර | 200,000/- | 250,000/- |
| වැඩමූලික හා පරිපාලක | 350,000/- | 400,000/- |

(ආ) ආයතනයේ අනුග්‍රහය යටතේ ලංකා බැංකුව මගින් ලබාදෙන නිවාස ණය මුදල (උපරිමය රුපියල් මිලියන 01) ස්ථිර සේවා කාලය වසර 05ක් හෝ ඊට වැඩි සේවක මහතුන් වෙත ලබාදීමට කටයුතු කරන අතර, ආපසු අය කර ගැනීමේ කාලය වසර 15 දක්වා දීර්ඝ කෙරේ. (මසකට උපරිමය ණය අයදුම්පත් 10ක් පමණක් සලකා බලනු ඇත.) මේ සඳහා බලපැවැත්වෙන සෙසු කොන්දේසි තවදුරටත් එලෙසම බලපැවැත්වෙනු ඇත.

(ii) වෛද්‍යාධාර රක්ෂණ යෝජනා ක්‍රමය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

2014 වර්ෂය තුළ වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට අදාළව බාහිර ප්‍රතිකාර වියදම් ප්‍රතිපූර්ණය කිරීම පමණක් සංශෝධනය කරන අතර සෙසු සංශෝධනයන් 2015 සහ 2016 වර්ෂයන් සඳහා පමණක් බලපැවැත්වේ.

| කරුණ | 2014 | 2015 | 2016 |
|---|---|---|---|
| බාහිර ප්‍රතිකාර වියදම් ප්‍රතිපූර්ණය කිරීම | රු. 32,400/- | රු. 35,000/- | රු. 37,750/- |
| නේවාසික ප්‍රතිකාර වියදම් ප්‍රතිපූර්ණය කිරීම | | රු. 142,500/- | රු. 154,000/- |
| රජයේ රෝහලක රෝහල්ගතවීම වෙනුවෙන් එක් දිනක ප්‍රතිපූර්ණය | | රු. 1,750/- | |
| පරිපූර්ණ වෛද්‍ය පරීක්ෂණය | | රු. 6,000/- | |
| නේවාසික වෛද්‍ය ප්‍රතිකාර CDL කොන්ත්‍රාත් පදනම | කිසිදු වෙනසක් සිදු නොවේ. | රු. 70,000/- | |
| සාමාන්‍ය දරු උපතක දී ප්‍රතිපූර්ණය කරනු ලබන මුදල | | රු. 50,000/- | |
| නිවුන් දරු උපතක දී ප්‍රතිපූර්ණය කරනු ලබන මුදල | | රු. 15,000/- | |
| රජයේ රෝහලක රෝහල්ගතවීමකදී නිර්දේශිත ඖෂධ පරීක්ෂණ සඳහා ප්‍රතිපූර්ණය කිරීම | | රු. 15,000/- | |
| විශේෂිත ශල්‍යකර්ම ප්‍රතිපූර්ණය කිරීමේ මුදලෙහි කිසිදු වෙනසක් සිදු නොවේ. | | සේවකයින් 10 දෙනෙකු සඳහා ලබාදුන් සහනය ඉතාමත් හදිසි අවස්ථාවක දී තවත් අමතර එක් අයකුට ලබාදීමට එකඟ වේ. | |

(iii) රෝගී තත්ත්වයකට අදාළව වෛද්‍ය නිර්දේශය මත ලබා දෙන විටමින් වර්ග සඳහා වැය වන මුදල් බාහිර වෛද්‍ය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිපූර්ණය කරනු ඇත.

(iv) හඳුනාගත් නිදන්ගත රෝගී තත්ත්වයට මුහුණ දී ඇති සේවක මහතුන් තෝරාගෙන ඔවුන් හට වසරකට වරක් උපදේශනාත්මක සේවාවක්/සායනයක් පැවැත්වීමට කටයුතු කෙරේ.

(v) **පැය 24** පුරා ආවරණය වන පුද්ගල හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය.

| | දැනට පවතින මුදල | සංශෝධිත මුදල |
|---|---|---|
| කාර්මික හා ලිපිකාර ශ්‍රේණිය | 375,000/- | 425,000/- |
| පරිපාලක ශ්‍රේණි | 400,000/- | 450,000/- |
| වැඩමුලික ශ්‍රේණි | 425,000/- | 475,000/- |

(vi) සේවක මහතෙකුගේ හෝ සේවිකාවකගේ මංගල උත්සව අවස්ථාවන්

- සේවක මහතෙකුගේ විවාහ උත්සවයකදී මංගල රථය වෙනුවෙන් ලබාදෙන දීමනාව රු. 8,500/- ක් දක්වා සංශෝධනය කෙරේ.
- මංගල උත්සවය සඳහා මාස 04කට සමාන මූලික වැටුපක් අත්තිකාරම් වශයෙන් වාරික 36කින් ආපසු අයකිරීමේ පදනම මත ලබාදීමට කටයුතු කෙරේ. මෙය ලබාදීමේදී ව්‍යවස්ථාපිත අඩුකිරීම් සීමාව පිළිබඳව සළකා බලා කටයුතු කරනු ඇත.

(vii) අවමංගල්‍ය අවස්ථාවන්

- සේවක දෙමාපිය/නැන්දනිය හෝ මාමණ්ඩියගේ අවසන් කටයුතු දිනයේ ලබාදෙන වෑන් රථය **දහවල් 11.30 න් පසු** මුදාහැරීමට කටයුතු කරන අතර, ඒ සඳහා තමාට හිමි නිවාඩු අයදුම් කිරීමට සේවක මහතා බැඳී සිටී. මේ සඳහා බලපැවැත්වෙන සෙසු කොන්දේසි තවදුරටත් එසේම බලපැවැත්වෙනු ඇත.
- සමාගම තුළ වසර 02 ක් හෝ ඊට වැඩි කාලයක් පුහුණුව ලබන පුහුණුවන්නකුගේ දෙමාපිය අවමංගල්‍යකට සහභාගිවීමට ස්ථිර සේවක මහතුන් 10 දෙනෙකුගේ සහභාගිත්වය මත ගාස්තුවලට යටත්ව බස්රථය මුදාහැරීමට කටයුතු කරන අතර, සෙසු නියමයන් හා කොන්දේසි එලෙසම බලපවත්වනු ඇත.

(viii) වන්දි මුදල් ගෙවීම/සහනයන් සැළසීම

රාජකාරි කාලය තුළ සිදුවන හදිසි අනතුරකදී මියයන සේවක මහතෙකු වෙනුවෙන් ගෙවනු ලබන වන්දි මුදල රු. 1,750,000/- දක්වා සංශෝධනය කෙරේ.


සාමාන්‍ය මරණයකදී සහනයක් සැළසීම සඳහා පිරිනමනු ලබන මුදල රු. 200,000/- දක්වා සංශෝධනය කෙරේ.

(ix) කාන්තාවන් සඳහා විවේකාගාරයක් ලබාදීමට කටයුතු කරනු ඇත.

(x) සුබසාධන පහසුකම් සේවා ගාස්තු සංශෝධනය

| කරුණ | පවතින ගාස්තුව | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| වාරිකා සඳහා වායුසමීකරණය කරන ලද බස් රථය | කි.මී. 01 ක් සඳහා රු. 37/- | කි.මී. 01 ක් සඳහා රු. 45/- |
| වායුසමීකරණය නොකරන ලද බස් රථය | කි.මී. 01 ක් සඳහා රු. 22/- | කි.මී. 01 ක් සඳහා රු. 30/- |
| තනිකඩ නිල නිවාස | රු. 150/- | රු. 200/- |
| නිවාස සංකීර්ණයේ තනිකඩ පදනම | රු. 250/- | රු. 400/- |
| විවාහක නිල නිවාස | රු. 500/- | රු. 750/- |

අවමගුල් කටයුතුවලට සහභාගිවීම සඳහා බස් රථය මුදාහැරීමේදී දැනට අයකරන ගාස්තුව සංශෝධනය නොකෙරේ. මීට අමතරව බස්රථය මුදාහැරීම සම්බන්ධයෙන් පවත්නා කොන්දේසි නොවෙනස්ව එලෙසම පවතිනු ඇත.


මෙයට සාක්ෂි වශයෙන් පාර්ශවයන් 2014 මැයි මස 22 වනදින අත්සන් තබන ලදී.

Chairman
Colombo Dockyard PLC
(Company No. PQ 50)

Ranil Wijegunawardena
Managing Director/CEO
Colombo Dockyard PLC

ස්වාධීන තටාක සේවක සංගමය
කොළඹ ඩොක්යාඩ් පී.එල්.සී
තැ. පෙ. 906,
කොළඹ 15.
ලියාපදිංචි අංකය 5373

Mangala De Silva
General Manager
(Human Resource Development & Administration)
(Company No. : PQ50)

## Salary Scales - A (For 2014 - 2016)

| Work Category | Grade | Scale |
|---|---|---|
| Industrial | SP | 23350/- 465/- X 75 58225/- |
| | HG | 21850/- 435/- X 75 54475/- |
| | I | 20350/- 405/- X 75 50725/- |
| | II | 19350/- 385/- X 75 48225/- |
| | III | 18350/- 365/- X 75 45725/- |
| | IV | 17350/- 345/- X 75 43225/- |
| Supervisory (Support) | I | 26200/- 525/- X 75 65575/- |
| | II | 25700/- 515/- X 75 64325/- |
| | III | 25200/- 505/- X 75 63075/- |
| Supervisory (Secondary) | I | 26400/- 530/- X 75 66150/- |
| | II | 25900/- 520/- X 75 64900/- |
| | III | 25400/- 510/- X 75 63650/- |
| Supervisory (Primary) | I | 26900/- 540/- X 75 67400/- |
| | II | 26400/- 530/- X 75 66150/- |
| | III | 25900/- 520/- X 75 64900/- |
| Foreman (Support) | SP | 29450/- 590/- X 75 73700/- |
| | HG | 28950/- 580/- X 75 72450/- |
| | I | 28450/- 570/- X 75 71200/- |
| | II | 28050/- 560/- X 75 70050/- |
| Foreman (Secondary) | SP | 30350/- 605/- X 75 75725/- |
| | HG | 29850/- 595/- X 75 74475/- |
| | I | 29350/- 585/- X 75 73225/- |
| | II | 28850/- 575/- X 75 71975/- |
| Foreman (Primary) | SP | 31350/- 625/- X 75 78225/- |
| | HG | 30850/- 615/- X 75 76975/- |
| | I | 30350/- 605/- X 75 75725/- |
| | II | 29850/- 595/- X 75 74475/- |
| Technical (Secondary) | SP | 30350/- 605/- X 75 75725/- |
| | HG | 29850/- 595/- X 75 74475/- |
| | I | 29350/- 585/- X 75 73225/- |
| | II | 28850/- 575/- X 75 71975/- |
| | III | 26400/- 530/- X 75 66150/- |
| | IV | 25900/- 520/- X 75 64900/- |
| Technical (Primary) | SP | 31350/- 625/- X 75 78225/- |
| | HG | 30850/- 615/- X 75 76975/- |
| | I | 30350/- 605/- X 75 75725/- |
| | II | 29850/- 595/- X 75 74475/- |
| | III | 26900/- 540/- X 75 67400/- |
| | IV | 26400/- 530/- X 75 66150/- |
| Clerical | Supra | 29450/- 590/- X 75 73700/- |
| | SP | 25700/- 515/- X 75 64325/- |
| | HG | 23700/- 475/- X 75 59325/- |
| | I | 20700/- 415/- X 75 51825/- |
| | II | 19700/- 395/- X 75 49325/- |
| | III | 18700/- 375/- X 75 46825/- |

## Salary Scales - B (For 2014 - 2016)

**Cook, Asst Cook, Kitchen Helper, Driver, Cleaner, Security Guard, Chaser, Medical Attendant & Asst, Stores Workers etc**

| Work Category | Grade | Scale |
|---|---|---|
| Industrial | SP | 16250/- 325/- X 75 40625/- |
| | HG | 15250/- 305/- X 75 38125/- |
| | I | 14250/- 285/- X 75 35625/- |
| | II | 13250/- 265/- X 75 33125/- |
| | III | 12250/- 245/- X 75 30625/- |
| | IV | 11250/- 225/- X 75 28125/- |
| Supervisory | I | 20000/- 400/- X 75 50000/- |
| | II | 19000/- 380/- X 75 47500/- |
| | III | 18000/- 360/- X 75 45000/- |
| Foreman | SP | 24050/- 480/- X 75 60050/- |
| | HG | 23050/- 460/- X 75 57550/- |
| | I | 22050/- 440/- X 75 55050/- |
| | II | 21050/- 420/- X 75 52550/- |



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.